වෙරිටේ විදසුන්

අප්‍රේල් 2021

09 වැනි වෙළුම
03 වැනි කාණ්ඩය

Verité Research
Strategic Analysis for Asia

වෙරිටේ රිසර්ච් යනු, ආර්ථික විද්‍යාව, නීතිය, දේශපාලනය සහ ජනමාධ්‍යය විෂයෙහි ඉහළ මට්ටමේ තීරකවරුන් සඳහා උපායමාර්ගික විශ්ලේෂණ සපයා දෙන, කොළඹ පිහිටි, ස්වාධීන බුද්ධි පර්ෂදයකි.

**සුහාෂිණී අබේසිංහ**
**මතීෂ අරංගල**
*පර්යේෂකයින්*

**නිශාන් ද මෙල්**
*විදසුන් මාලා සංස්කාරක*


Image courtesy of Pexels

# "පොදු දත්ත" පුද්ගලීකරණය කිරීම: ශ්‍රී ලංකා රේගුව උදාහරණයක් ලෙස

**7**

වෙළඳ දත්ත නොමිලයේ සපයන දකුණු ආසියානු රටවල් ගණන; ශ්‍රී ලංකාව පමණක් ගාස්තුවක් අය කරයි

**107**

එක්සත් ජාතීන්ගේ COMTRADE දත්ත ගබඩාවේ ඇති ශ්‍රී ලංකාවේ දත්ත යල්පැන ගොස් ඇති මාස ගණන

**60%**

දත්ත විකිණීමෙන් ලැබෙන ආදායමෙන් රේගුවේ නිලධාරීන්ට ලබා දෙන කොටස

ජාත්‍යන්තර වෙළඳ දත්ත පොදු දේපලකි. සැබෑ කරුණු මත පදනම් වූ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට, ව්‍යාපාරවලට වඩාත් නිවැරදි තීරණ ගැනීමට, ආර්ථික හා සමාජීය කරුණු පිළිබඳ මහජන පර්යේෂණ සඳහා පෙළඹවීමට සහ ජනතාවට රජයේ වගවීම වැඩි දියුණු කිරීමට දත්ත සඳහා ප්‍රවේශය අත්‍යවශ්‍ය වේ. එහෙත්, ශ්‍රී ලංකා රේගුවේ දත්ත බෙදා හැරීමේ ප්‍රතිපත්තිය දත්ත පොදු භාණ්ඩ ලෙස දැකීමට පටහැනි ආකාරයෙන් සකස් වී ඇත. කලාපීය හා ගෝලීය ප්‍රවණතාව වන්නේ මෙම දත්ත වලට ඇති ප්‍රවේශය පහසු කිරීම වුව ද, ලංකාව සම්බන්ධයෙන් යාවත්කාලීන දත්ත සොයා ගැනීම පහසු නොවන අතරම ඒවා නොමිලයේ ලබා ගත නොහැක. මෙම විශ්ලේෂණයෙන් පෙනී යන්නේ වෙළඳ දත්ත සඳහා එවැනි ප්‍රවේශයක් ලබාදීමට ශ්‍රී ලංකා රේගුව දක්වන අකමැත්තට ප්‍රධාන හේතුවක් වන්නේ පොදු දත්ත අලෙවිය හරහා රාජ්‍ය නිලධාරීන්ට පෞද්ගලික ආදායම් ඉපයීමට අනුබල දෙන, මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ ශ්‍රී ලංකා රේගුව තුළ දැනට ක්‍රියාත්මක වන ක්‍රියාවලිය බවයි.

රජයේ ආයතන විසින් රැස්කර තබා ගන්නා දත්ත වටිනා "පොදු දේපලක්" වේ. නිසි ලෙස උපයෝගී කර ගත් විට, එවැනි දත්ත ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට වඩා යහපත් දායකත්වයක් ලබා දීම සඳහා පෞද්ගලික අංශයට හා රාජ්‍ය අංශයට උපකාරී වේ. මෙම දත්ත ගොනු මහජන මුදල් වැය කර සම්පාදනය කරනු ලැබේ. එසේ කිරීමට හේතුව වන්නේ මහජන සුබසිද්ධිය සඳහා එවැනි දත්ත යොදවිය හැකි වීමයි. ආර්ථික සංවර්ධනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට මෙම දත්ත ගොනු උපයෝගී කර ගැනීම තුළින් මහජන සුබසිද්ධියට ඒවා බෙහෙවින් දායක කර ගත හැක.

මෙම විශ්ලේෂණය මගින් පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සහ මහජන සුබසිද්ධියට එම දත්ත ගොනු යොදා ගැනීමට ඇති හැකියාව, රජයේ නිලධාරීන් පිරිසක් විසින් මෙම දත්ත වලින් පුද්ගලිකව ලාභ ලබා ගැනීමට උත්සාහ කිරීම හේතුවෙන් අඩපණ වී ඇති ආකාරයයි. අවාසනාවකට මෙන්, මෙවැනි ක්‍රියාවන්ට අනුබල දෙන මුදල් අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති මගින් මෙම පටු පෞද්ගලික අවශ්‍යතා පෝෂණය වෙමින් තිබේ.

මහජන දත්ත පුද්ගලීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජයේ නිලධාරීන් මුදල් අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ඊට-

අනුබල දෙන යෝජනා ක්‍රමයක සහය ලබාගනියි. එම යෝජනා ක්‍රමය පිළිබඳ කරන ලද මෙම විශ්ලේෂණයෙන් පෙන්වා දෙන්නේ, එමගින් අයහපත් ප්‍රතිඵල ඇතිකරවන බවත්, ඒවා නැවත සලකා බලා වෙනස් කිරීමට කටයුතු කිරීම අවශ්‍ය බවත්ය.

## මහජන මුදලින් සැකසූ දත්ත "පොදු භාණ්ඩයක්" ලෙස සැලකීමේ වැදගත්කම

**ජනතා බදු මුදල් භාවිතා කර රජය ඇතැම් වත්කම් නිර්මාණය කර ඒවා ජනතාවට නොමිලයේ ලබා දීම වැදගත් වන්නේ මන්ද යන්න "පොදු භාණ්ඩ" පිළිබඳ ආර්ථික න්‍යායෙන් පැහැදිලි වේ. වත්කමක්, නිදහසේ / නොමිලයේ ලබා ගත හැකි පොදු භාණ්ඩයක් ලෙස තීරණයට යොදා ගන්නා ප්‍රධාන නිර්ණායකය වන්නේ එය පරිශීලනය සඳහා "ප්‍රතිවාදීන් ලෙස තරඟ කිරීමේ අවශ්‍යතාවක් නොමැති" වීමේ තත්වයයි. එනම්, එක් පුද්ගලයෙකු විසින් එය භාවිතා කිරීම සහ ප්‍රතිලාභ ලබා ගැනීම, තවත් පුද්ගලයෙකුට එය භාවිතා කිරීමට සහ ප්‍රතිලාභ ලබා ගැනීමට ඇති හැකියාව අහිමි නොකිරීමයි. වීදි ලාම්පු සහ පොදු උද්‍යානයන් ඒ සඳහා සරල උදාහරණ වන්නේය.[1]**

රජය විසින් සම්පාදනය කරන ලද "දත්ත ගොනු" පොදු භාණ්ඩයකි. ඒවා පෞද්ගලික භාණ්ඩ වශයෙන් බෙදා හැරීමට උත්සාහ කිරීම වීදි ලාම්පු සඳහා රියදුරන්ගෙන් මුදල් අය කිරීමක් වැනිය. එය සමාජයීය හෝ ආර්ථිකමය වශයෙන් බලන කල අර්ථාන්විත ක්‍රියාවක් නොවේ.

පොදු භාණ්ඩයක සමාජයීය/ ආර්ථිකමය ප්‍රතිලාභ මනිනු ලබන්නේ එහි භාවිතය මත මිස, එයින් උපයන ආදායම අනුව නොවේ. මෙයට හේතුව භාවිතා කරන්නන් සංඛ්‍යාවට අනුරූපව මුළු පිරිවැයෙහි වෙනසක් නොවීමයි. එසේත් නැතිනම් තවත් අයෙකු එය භාවිතා කිරීම නිසා දරන්නට වන පිරිවැය හෙවත් ආන්තික පිරිවැය ශුන්‍ය වීමයි. එබැවින්, පොදු භාණ්ඩ ස්වරූපයෙන් ඇති භාණ්ඩ සඳහා, ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන වන තාක් දුරට නිෂ්පාදනය කිරීමේ මූලික ආර්ථික ප්‍රශස්තකරණ කොන්දේසිය සැපිරීම සඳහා ශුන්‍ය පිරිවැයකින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම අවශ්‍ය වේ - එනම්, උපරිම පාරිභෝගිකයින් සංඛ්‍යාවකට ඒ සඳහා නිදහසේ හා පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව සලසා දිය යුතුය.

සෞඛ්‍ය, අධ්‍යාපනය, කෘෂිකර්මාන්තය, ජාත්‍යන්තර වෙළඳාම, ජනගහනය සහ සේවා නියුක්තිය පිළිබඳ සංඛ්‍යාලේඛන මෙවැනි "පොදු භාණ්ඩ" ගණයට වැටෙන වත්කම් වලට උදාහරණ වේ. සැබෑ කරුණු මත පදනම් වූ ප්‍රතිපත්ති සැලසුම් කිරීමට, ආර්ථිකයේ ඵලදායී අංශවල සිටින අයට වඩාත් නිවැරදි තීරණ ගැනීමට, ආර්ථික හා සමාජීය කරුණු පිළිබඳ මහජන පර්යේෂණ සඳහා පෙළඹවීමට සහ රටේ සමස්ත සමාජ හා ආර්ථික ප්‍රතිඵල වැඩිදියුණු කිරීමට එවැනි දත්ත සඳහා ප්‍රවේශය අත්‍යවශ්‍ය වේ.

"පොදු භාණ්ඩ" වලින් කෙරෙන කාර්යය "දත්ත ගොනු" හරහා ලබා ගැනීමට ඇති මාර්ගය වන්නේ ඒවා හැකි තරම් පහසුවෙන් සහ නිදහසේ ලබා ගත හැකි තත්වයට පත්කිරීමයි. පොදු භාණ්ඩ පිළිබඳ ආර්ථික න්‍යාය පොදු දත්ත ගොනු සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන අපොහොසත් වී තිබේ. මෙම විශ්ලේෂණය-මගින් මෙම ගැටලුවේ බරපතලකම ශ්‍රී ලංකා රේගුවේ (SLC) දත්ත බෙදා හැරීමේ ප්‍රතිපත්තිය සිද්ධි අධ්‍යයනයක් ලෙස යොදා ගනිමින් පෙන්වා දෙයි.

## දත්ත "පොදු භාණ්ඩ" ලෙස දැකීමට අපොහොසත් වීම සහ ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකාව පිළිබඳ අපනයන හා ආනයන සංඛ්‍යාලේඛන එකතු කර තබා ගන්නා මූලික ආයතනය ශ්‍රී ලංකා රේගුවයි (SLC). ශ්‍රී ලංකා රේගුවේ දත්ත බෙදා හැරීමේ ප්‍රතිපත්තිය මේ වන විට දත්ත පොදු භාණ්ඩ ලෙස දැකීමට පටහැනි ආකාරයෙන් සකස් වී ඇත. යාවත්කාලීන දත්ත සොයා ගැනීම හෝ ප්‍රවේශ වීම පහසු නොවන අතරම ඒවා නොමිලයේ ලබා නොදෙයි.

දත්ත "පොදු භාණ්ඩ" ලෙස සැලකීමට අපොහොසත් වීම, ශ්‍රී ලංකාව ගෝලීය තලයේ පසුගාමී රටක් බවට පත්වීමට ද හේතුවී තිබේ. ලෝකයේ බොහෝ රටවල් පමණක් නොව බොහෝ දකුණු ආසියානු රටවල් පවා වෙළඳ දත්ත "පොදු භාණ්ඩ" ලෙස සලකා නොමිලයේ හා පහසුවෙන් ලබා ගැනීමට සැලැස්වීමේ ආර්ථික වැදගත්කම හඳුනාගෙන ඉදිරියට ගොස් ඇති අතර ඊට සාපේක්ෂව ලංකාව සිටින්නේ ඉතා පසුගාමී තැනකය. වෙළඳ දත්තවලින් ලබා ගතහැකි, ශ්‍රී ලංකාවේ ආර්ථික සාර්ථකත්වයට ඉතා වැදගත්වන ප්‍රතිලාභ රුසක් 1 වන කොටුව තුළ දක්වා තිබේ.

කලාපීය හා ගෝලීය වශයෙන් දකින්නට ලැබෙන, නොමිලයේ අන්තර්ජාලය හරහා වෙළඳ දත්ත ලබා දීමේ ප්‍රවණතාවයට සාපේක්ෂව වෙළඳ දත්ත පිළිබඳ ශ්‍රී ලංකා රේගුවේ ප්‍රතිපත්තිය ඉතා පසුගාමීය. මෙම විශ්ලේෂණයෙන් පෙනී යන්නේ වෙළඳ දත්ත සඳහා එවැනි ප්‍රවේශයක් ලබා දීමට ශ්‍රී ලංකා රේගුව දක්වන අකමැත්තට ප්‍රධාන හේතුවක් වන්නේ ශ්‍රී ලංකා රේගුව තුළ දැනට පවතින, දත්ත අලෙවි කර පුද්ගලිකව ලාභ ලැබීමට අනුබල දෙන ක්‍රියාවලිය බවයි. මෙම ක්‍රියාවලිය වෙළඳ දත්ත නොමිලයේ-

1 වන කොටුව: වෙළඳ දත්තවල ප්‍රතිලාභ:

වෙළඳ දත්ත පහසුවෙන් ලබා ගැනීමට ඇති හැකියාව ප්‍රවර්ධනය කිරීමෙන් ශ්‍රී ලංකාවට සැලකිය යුතු ප්‍රතිලාභ ලබාගත හැකිය. වෙළඳ දත්ත, පහත කර්තව්‍යයන් සඳහා ඉතා වැදගත්ය.

- කෝවිඩ් -19 නිසා ජාත්‍යන්තර වෙළඳාමට වන බලපෑම අවබෝධ කර ගැනීමට හා එනිසා පැනනගින අභියෝග ජය ගැනීමටත්, නව ව්‍යාපාරික අවස්ථා වලින් ප්‍රයෝජන ගැනීමටත් අවශ්‍ය උපාය මාර්ග සකස් කිරීමට
- සැබෑ කරුණු පදනම් කරගත් වෙළඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට සහ පවතින ප්‍රතිපත්ති වල ඵලදායීතාවය ඇගයීමට
- පවත්නා සහ යෝජිත නිදහස් වෙළඳ ගිවිසුම්වල වාසි සහ අවාසි තක්සේරු කිරීමට සහ අවාසි අවම කරගනිමින් වාසි උපරිම කරගැනීම සඳහා උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට
- ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ට වෙළඳපළ ප්‍රවණතා, වෙළඳපොල පවතින තරඟය, නිදහස් වෙළඳ ගිවිසුම්වල බලපෑම හඳුනා ගැනීමට
- විදේශ ව්‍යාපාරිකයන්ට ශ්‍රී ලංකාවේ පවතින වෙළඳ සහ ආයෝජන අවස්ථා හඳුනා ගැනීමට

1 වෙරිටේ පෙර විශ්ලේෂණය බලන්න: 'සෙස් - රැවටීම අවසන් කර වීදි ලාම්පු සාදන්න', 2013 නොවැම්බර් 27, මෙහි දී ලබා ගත හැකිය http://www.dailymirror.lk/39394/cess-end-the-deception-and-build-street-lights

පහසුවෙන් ලබා ගැනීමට අවස්ථාවක් සලසා දීමට බාධාවක් වී ඇත.

### වෙළඳ දත්ත ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෝලීය තලයේ පසුගාමී තැනක පසු වේ.

වෙළඳ දත්ත "පොදු දේපලක්" ලෙස පිළිගත් සහ එම දත්ත පහසුවෙන් සහ නොමිලයේ ලබා ගැනීමට සැලසීමෙන් ලැබෙන ප්‍රතිලාභ අවබෝධ කර ගත් කලාපීය මෙන්ම ලෝකයේ අනෙකුත් රටවල් යාවත්කාලීන හා විශ්වාසදායක නිල වෙළඳ සංඛ්‍යාලේඛන නොමිලයේ, ක්ෂණිකව අන්තර්ජාලය හරහා ලබා ගත හැකි වෙබ් අඩවි ස්ථාපිත කරමින් සිටී.

> **රජය විසින් සම්පාදනය කරන ලද "දත්ත ගොනු" පොදු භාණ්ඩයකි. ඒවා පෞද්ගලික භාණ්ඩ වශයෙන් බෙදා හැරීමට උත්සාහ කිරීම වීදි ලාම්පු සඳහා රියදුරන්ගෙන් මුදල් අය කිරීමක් වැනිය. එය සමාජයීය හෝ ආර්ථිකමය වශයෙන් බලන කල අර්ථාන්විත ක්‍රියාවක් නොවේ.**

පළමුව, වෙළඳ දත්ත අන්තර්ජාලය හරහා ලබා දෙන ජාත්‍යන්තර වෙබ් අඩවි වල ඇති ශ්‍රී ලංකාවේ දත්ත යල් පැන ගොස් තිබේ. මෙනිසා ශ්‍රී ලංකාවට වටිනා අපනයන සහ ආයෝජන අවස්ථා අහිමි වීමට හේතු විය හැකි බැවින් මෙය ගැටලුවක් වේ.

වෙළඳ දත්ත පහසුවෙන් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය වැනි ජාත්‍යන්තර ආයතන ඉදිරිපත් වී තිබේ. එක්සත් ජාතීන්ගේ COMTRADE සහ ITC trademap වැනි ගෝලීය දත්ත සමුදායන් ලොව පුරා රටවල් විශාල සංඛ්‍යාවක වෙළඳ දත්ත අන්තර්ජාලය හරහා නොමිලයේ සපයයි. මෙම දත්ත සමුදායන් මඟින් ලෝක වෙළඳපොළ තුළ තම රටවල ව්‍යාපාරවලට ලැබෙන අවස්ථාවන් සහ අභියෝග තේරුම් ගැනීමට ඒ ඒ රටවල සිටින ප්‍රතිපත්ති සම්පාදකයන්ට, ව්‍යාපාරිකයන්ට, පර්යේෂකයන්ට අවස්ථාවක් ලබා දෙයි.

> **අන්තර්ජාලය හරහා නොමිලේ දත්ත ලබා දීමට අපොහොසත් වන එකම දකුණු ආසියානු රට ශ්‍රී ලංකාවයි.**

මෙම ජාත්‍යන්තර දත්ත සමුදායන් සහිත වෙබ් අඩවි වල ඇති ශ්‍රී ලංකාවේ වෙළඳ--දත්ත යාවත්කාලීන කිරීමට ශ්‍රී ලංකාව අපොහොසත් වී ඇත. උදාහරණයක් ලෙස, COMTRADE දත්ත ගබඩාවේ ඇති ශ්‍රී ලංකාවේ වාර්ෂික වෙළඳ දත්ත වසර 2 කින් යල් පැන ගොස් තිබේ. ඊට සාපේක්ෂව, රටවල් 41 ක් (ඉන්දියාව සහ පකිස්ථානය වැනි අසල්වැසි රටවල්ද ඇතුළුව) 2020 දක්වා යාවත්කාලීන වූ වාර්ෂික වෙළඳ දත්ත මෙම වෙබ් අඩවි වලට ලබා දීමට කටයුතු කර ඇත. 2021 පෙබරවාරි මස වන විට රටවල් 54 ක් (ඉන්දියාව සහ පාකිස්තානය ද ඇතුළුව) අවම වශයෙන් 2020 ඔක්තෝබර් මාසය වන තෙක් තම රටවල වෙළඳාම සම්බන්ධ මාසික දත්ත මෙම ජාත්‍යන්තර දත්ත ගබඩාවට ලබා දී ඇති නමුත් එහි ඇති ශ්‍රී ලංකාවේ වෙළඳාම පිළිබඳ මාසික දත්ත මාස 107 කින් යල් පැන ගොස් ඇත.

දෙවනුව, ගාස්තු ගෙවීමකින් තොරව අන්තර්ජාලය හරහා නොමිලේ වෙළඳ දත්ත ලබාදීමට අපොහොසත්ව ඇති එකම දකුණු ආසියාතික රට බවටත් ශ්‍රී ලංකාව පත්ව ඇත. ඇෆ්ගනිස්ථානය පවා මේ කාරණයේ දී, සිටින්නේ අපට ඉදිරියෙන්ය.

තවමත් ජනතාවට ශ්‍රී ලංකා රේගුවෙන් වෙළඳ දත්තවල මෘදු පිටපතක් ලබා ගැනීමට භෞතිකව පරිශ්‍රයට පැමිණ මුදල් ගෙවීමක් සිදු කිරීමට අවශ්‍ය වේ[2]. ශ්‍රී ලංකා රේගුව අනුගමනය කල මෙම පිළිවෙත නිසාවෙන්, 2019 අවසානය වන විට, වෙළඳ දත්ත අන්තර්ජාලය හරහා ලබා නොදුන් එකම දකුණු ආසියානු රට බවට ශ්‍රී ලංකාව පත් වී තිබිණි.

මෙම පරතරය පියවා ගැනීම සඳහා 2020 දී අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) ඉදිරිපත් වීමත් සමඟ තත්වය යහපත් අතට හැරී තිබේ. අපනයන සංවර්ධන මණ්ඩලය විසින් අන්තර්ජාලය හරහා වෙළඳ දත්ත ලබා ගැනීමට හැකියාව ඇති කිරීමට කටයුතු කිරීම වෙළඳ දත්ත සම්බන්ධයෙන් නිවැරදි දිසාවට තැබූ සාධනීය පියවරකි. කෙසේ වෙතත්, අපනයන සංවර්ධන මණ්ඩල අන්තර්ජාල වේදිකාව කාලීන නිවැරදි දත්ත ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව මත රඳා පවතී. එසේම, අපනයන සංවර්ධන මණ්ඩලය මාසික වෙළඳ දත්ත ලබා දෙන්නේ නැත. දකුණු ආසියාවේ අනෙකුත් රටවල අන්තර්ජාල දත්ත ගබඩා හරහා දත්ත ලබා ගැනීමේ පහසුව සමග සංසන්දනයේදී, අපනයන සංවර්ධන මණ්ඩලයේ දත්ත ගබඩාව මඳක් පසුපසින් සිටී; දත්ත වලට ප්‍රවේශ වීම සඳහා පරිශීලකයින්ට තවමත් දත්ත ලබා ගැනීම සඳහා වාර්ෂිකව ලියාපදිංචි වීම අවශ්‍ය වන අතර, ඒ සඳහා ගාස්තුවක් ගෙවීමටද අවශ්‍ය වේ.

### වැරදි අනුබලදීම් නිසා ලැබෙන ප්‍රතිඵල අහිතකරය.

වෙළඳ දත්ත සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අසාර්ථකත්වයටත්, ජාත්‍යන්තර තලයේ පසුගාමිත්වයටත් ප්‍රධාන හේතුවක් වන්නේ, රාජ්‍ය නිලධාරීන්ට ලබා දී ඇති වැරදි අනුබලදීම්ය. වර්තමානයේ රජය දත්ත සැඟවීමට සහ මිල අධික කිරීමට රාජ්‍ය නිලධාරීන්ට අනුබල දෙයි.

අනෙකුත් රටවල් අන්තර්ජාලය හරහා නොමිලයේ දත්ත ලබා දීමට සිය රාජ්‍ය නිලධාරීන්ට අනුබල දෙන ලෝකයක, ශ්‍රී ලංකා රජය සිය රජය නිලධාරීන්ට අනුබල දී ඇත්තේ ඊට ප්‍රතිවිරුද්ධ ලෙස ක්‍රියා කිරීමටය.

> **වෙළඳ දත්ත අන්තර්ජාලය හරහා ලබා දෙන ජාත්‍යන්තර වෙබ් අඩවිවල ඇති ශ්‍රී ලංකාවේ දත්ත යල් පැන ගොස් තිබේ. මෙනිසා ශ්‍රී ලංකාවට වටිනා අපනයන සහ ආයෝජන අවස්ථා අහිමි වීමට හේතු විය හැකි බැවින් මෙය ගැටලුවක් වේ.**

රජය හඳුන්වාදී ඇති ක්‍රමවේදය මගින් මහජන මුදලින් සැකසූ පොදු දත්ත අලෙවි කිරීම, පෞද්ගලික ආදායම් මාර්ගයක් බවට පත් කර ගැනීමට රාජ්‍ය නිලධාරීන්ට අනුබල දී ඇත. 2004 නොවැම්බර් 16 දින මුදල් අමාත්‍යංශය (MOF) විසින් නිකුත් කරන ලද ලිපියක් මගින් ශ්‍රී ලංකා රේගුවට වෙළඳ දත්ත විකිණීමට සහ ලැබෙන ආදායම පහත පරිදි බෙදීමට අවසර ලබා දී තිබේ; ලැබෙන ආදායමෙන් 40% ක් මුදල් අමාත්‍යංශයේ ඒකාබද්ධ අරමුදලට වෙන් කළ යුතු අතර, ඉතිරි 60% දත්ත සම්පාදනය කිරීමේ නිලධාරීන් අතර ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි බෙදා හැරීමට නියමිතය[3].

මෙය පොදු වත්කමක් විකිණීමෙන් පුද්ගලිකව මුදල් ඉපයීමට රජයේ නිලධාරීන්ට පැහැදිලි අවසරයක් ලබා දී ඇති අවස්ථාවකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මහජන අරමුදල් භාවිතයෙන් ජනනය කරන දත්ත නොමිලයේ ලබා ගැනීමට හැකි වීම හරහා මහජනයාට සහ රටට අත්පත් කරගත හැකි ප්‍රතිලාභය අහිමි වී තිබේ.


### මෙම අනුබලදීම් හඳුන්වාදීමේ දී, පාදක කරගත් අරමුණම වැරදි එකක් විය හැක.

ගාස්තු අයකොට දත්ත සැපයීම සාධාරණීකරණය කිරීමට පදනම් වන එක කාරණයක් වන්නේ රජයේ දෙපාර්තමේන්තු භාණ්ඩාගාරය මත ඇති රැඳියාව අඩු කිරීමයි. එහෙත් දත්ත සම්බන්ධයෙන් මෙවැනි ප්‍රවේශයක් අනුගමනය කිරීමට ගත් තීරණය, දත්ත වල ආර්ථික වටිනාකම පිළිබඳ නිවැරදි අවබෝධයකින් තොරව ගන්නා ලද තරක තීරණයකි.

රජයන්ගේ මූලික අරමුණු වලින් එකක් වන්නේ ප්‍රගතිශීලී බදුකරණය තුළින්-

2 සවිස්තරාත්මක නිෂ්පාදන කාණ්ඩය (HS කේත අංක 8ක මට්ටම) සහ ඊට අනුරූප වෙළඳාම් කළ රට (අපනයන ගමනාන්තය සහ ආනයන ප්‍රභවය) අනුව වසරක සම්පූර්ණ අපනයන හා ආනයන සංඛ්‍යාලේඛන ලබා ගැනීම සඳහා පිරිවැය රුපියල් 20,000 කි.

**1 වන රූප සටහන: වෙළඳ සංඛ්‍යාලේඛන විකිණීමෙන් ලැබෙන ආදායම යන්නේ කොතැනකටද?**




මූලාශ්‍රය- ශ්‍රී ලංකා රේගුවට කළ තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) ඉල්ලීමක් මගින් 2018 නොවැම්බර් 11 වන දින වෙරිටේ රිසර්ච් වෙත ලැබුණු තොරතුරුවලට අනුව.

-ආදායම් උත්පාදනය කර, එම මුදල් යොදවා ගාස්තු රහිතව පරිශීලනය කළ හැකි පොදු භාණ්ඩ ජනතාවට සැපයීමයි. එහෙත් රජයන් තමන්ට ආදායම් ඉපයීමට ඇති මාර්ග සීමිත වන විට, පොදු දේපල, "පොදු භාණ්ඩ" ලෙස සලකා නොමිලයේ පරිශීලනය කිරීමට ඉඩ දීම මහජන සුබසිද්ධියට හේතු වන අවස්ථාවලදී පවා, ඒවා පරිශීලනයට ගාස්තු අයකිරීමට පෙළඹීමට ඉඩ ඇත. එවන් පොදු භාණ්ඩ වලට උදාහරණ ලෙස වීදි ලාම්පු, උද්‍යාන, දත්ත දැක්විය හැක. මෙසේ ක්‍රියා කිරීම රටක ආර්ථික සාර්ථකත්වය ප්‍රවර්ධනයට වඩා එය අඩපණ කිරීමට හේතු වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන ආර්ථික අසාර්ථකත්වය බදු ආදායම අඩු කරවන අතර එය රජය මුහුණ දී ඇති ආදායම් ගැටලුව තවත් උග්‍ර කිරීමට හේතු වේ.

**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත හරහා ලබා ගත් තොරතුරු පෙන්වා දෙන්නේ, රජයේ ආදායම් ඉපයීමේ අරමුණට දායක වීමටද වත්මන් ක්‍රියාවලිය අසමත් වී ඇති බවයි.**

වෙරිටේ රිසර්ච් ආයතනය විසින් ගොනු කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් සපයන ලද තොරතුරු වලින් හෙළි වූයේ 2017 දී ශ්‍රී ලංකා රේගුව වෙළඳ දත්ත විකිණීමෙන් රුපියල් මිලියන 8.6 ක් උපයා ඇති බවයි. මෙයින්, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපියට අනුව, රුපියල් මිලියන 5.16 ක් දත්ත එකතු කරන ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන්ට ලැබිය යුතුය[4]. (1 වන රූප සටහන බලන්න). මෙයින් අදහස් කරන්නේ දත්ත ලබා ගැනීමට ඇති හැකියාව සීමා කිරීම හරහා ආර්ථිකයට අහිතකර බලපෑමක් ඇති කරන ක්‍රියා මාර්ගයකට අනුබල දීමෙන් රජය උපයා ඇත්තේ රුපියල් මිලියන 3.5 ක් පමණක් බවයි.

මෙය ශ්‍රී ලංකා රේගුව විසින් ආනයන බදු මගින් එකතු කරන ලද මුළු ආදායමෙන් 0.0004% ක ප්‍රමාණයක් පමණි.

මෙවැනි අනුබල දීමකින් රජය බලාපොරොත්තු වූයේ, සාමාන්‍යයෙන් අලස රාජ්‍ය නිලධාරීන්, දත්ත සැපයීමට සහ දත්ත පරිශීලනය කරන්නන්ට වඩාත් හොඳ සේවයක් ලබා දීමට උනන්දු කරවීම නම්, එම බලාපොරොත්තුවද ඉටු වී නැත[5]. දත්ත නොමිලයේ පහසුවෙන් ලබා නොදීමට අමතරව, ගාස්තු අයකර සේවා ලබා දෙන අවස්ථාවලදී රාජ්‍ය ආයතනයක් විසින් පාරිභෝගිකයන්ට ලබා දිය යුතු මූලික තොරතුරු පවා ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා රේගුව අපොහොසත් වී ඇත. එනම්, ලබා ගත හැකි දත්ත වර්ග, දත්ත ලබා ගැනීමට ගෙවිය යුතු ගාස්තු, දත්ත ලබා දීමට ගතවන කාලය සහ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා සම්බන්ධතා දුරකථන අංක වැනි තොරතුරු ද ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කර නැත/සිය වෙබ් අඩවියේ සඳහන් කර නොමැත. ◆

3 ශ්‍රී ලංකා රේගුවට ලේඛනගත දත්ත බෙදා හැරීමේ ප්‍රතිපත්තියක් නොමැති බව සැලකිල්ලට ගත යුතුය. ශ්‍රී ලංකා රේගුවට කරන ලද තොරතුරු දැන ගැනීමේ අයිතිය (RTI) ඉල්ලීමකට ප්‍රතිචාරයක් ලෙස 2018 නොවැම්බර් 11 වන දින වෙරිටේ රිසර්ච් වෙත ලැබුණු තොරතුරු මගින් මෙම ප්‍රතිපත්ති සටහනේ පහත දැක්වෙන කොටස්වල නිරීක්ෂණ හඳුනාගෙන ඇත.

4 ශ්‍රී ලංකා රේගුවට තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) ඉල්ලීමක් මගින් 2018 නොවැම්බර් 11 වන දින වෙරිටේ රිසර්ච් වෙත ලැබුණු තොරතුරුවලට අනුව.

5 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ නිකුත් කර ඇති තොරතුරු කල්තියා හෙළිදරව් කිරීම පිළිබඳ අංක 20 දරණ රෙගුලාසියට, අනුව පවත්නා දත්ත එකතුන් හා ඒවාට සාමාන්‍ය ජනතාවට ප්‍රවේශවීමේ හැකියාව පිළිබඳ තොරතුරු රජයේ ආයතන විසින් නිරන්තරයෙන් හෙළි කිරීම අවශ්‍ය වේ.